**Contract No RDA/KDY/CE//2024/13,**

**ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**මහනුවර**

**2024.03. 21**

........................................
........................................
........................................
........................................

**මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉදිකර ඇති පේරාදෙණිය ශික්ෂණ රෝහල අසළ ඇති මගී උමං මාර්ගයේ අංක 03,04,05 දරණ කඩ කාමර 03 වෙන් වෙන් වශයෙන් වාර්ෂික බදු පදනම මත ලබා දීමට ටෙන්ඩර් කැඳවීම.**

**<u>කොන්දේසි</u>**

1. **ලංසු අයදුම්පත් පිළිගැනීම / ප්‍රතික්ෂේප කිරිම:**

1.1 මේ සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් 2024.03.25 දින සිට 2024.04.09 දින දන්වා පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා කාලය තුල මාර්ග සංවර්ධන අධිකාරියේ මහනුවර ප්‍රධාන ඉංජිනේරු කාර්යායෙන් නැවත නොගෙවනු ගාස්තුව රු 3,025.64 ක් ( TAX සමග ) ගෙවා සම්පූර්ණ ලංසු කට්ටලක් ලබා ගත හැක.

1.2 2024.04.10 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත් සභාපති, ප්‍රදේශීය ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, අස්ගිරිය, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් බහාලනයට ගෙනැවිත් බහාලීම කළ යුතුය. ඉන් පසුව එදිනම ප.ව. 2.30ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

1.3 එම එක් එක් වෙළඳ කුටිය සඳහා ලංසුවේ දක්වා ඇති මිළ ගණන ඇගයීම වෙන්වෙන්ව සිදුකරනු ඇත.

1.4 ලංසු විවෘත කරන වේලාවෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක මත භාරගනු නොලැබේ.

1.5 එක් කඩකාමරයක් සඳහා නැවත ගෙවනු ලබන රු 10,000.00 ක ලංසු ආරක්ෂණයක් (bid Security) ඉදිරිපත් කළ යුතුය. (2024.06.10 දින දක්වා වලංගු විය යුතුය.) වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.6 යම් අයදුම්කරුවෙකු සියළු සුදුසුකම් සපුරා ඔහු තෝරා ගනු ලැබුවහොත් පසුව ඔහු විසින්ම එම ලංසුව ලබා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් එම අවස්ථාවේදි මෙම ලංසු ආරක්ෂණය (bid Security) නැවත අයදුම්කරු වෙත නොගෙවන අතර එය මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

10. මෙම උමං සංකීර්ණයේ පිහිටි ව්‍යාපාරික ස්ථානවලට පිවිසෙන දොරටුව ප.ව.8.00 සිට පෙ.ව.5.00 දක්වා වසා තැබිය යුතු බැවින් එම කාලය තුල ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවසර නොමැත.

11. විදුලිය වැනි අත්‍යවශ්‍ය යම්කිසි සේවාවක් නැවතීමක් හෝ ඇණහිටීමක් වැනි බාධාවක් සිදුවුවහොත් එය ව්‍යාපාරික ස්ථානයේ මාසික කුලිය නොගෙවා සිටීමට හේතුවක් නොවනු ඇත.

12. මෙම ගිවිසුම යටතේ ලබා දී ඇති කඩකාමරය තුල මස්,මාළු හා මත්පැන් අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

13. බදු ගිවිසුමෙහි සදහන් කාලය අවසන් වීමට පෙර කඩකාමරයෙන් ඉවත්වන්නේ නම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාස 03 කට පෙර දැනුම් දිය යුතු අතර ඉවත්වීමට පෙර ගෙවීමට ඇති සියළු හිග මුදල් ගෙවීම් කල යුතුය.

14. මොනයම් හේතුවක් නිසා හෝ ව්‍යාපාරය කරගෙන යාමට අපොහොසත් වුවහොත් හෝ කඩකාමරය අතහැර දැමුවහොත් හෝ මුලින් ගෙවා ඇති සියලුම තැන්පත් මුදල් අධිකාරිය සතුවන අතර එම මුදල හෝ ඉන් කොටසක් ඉල්ලා සිටීමට අයිතිවාසිකම් බදු හිමිකරුට නොමැත.

15. හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නේ නම් හවුල් ව්‍යාපාර ආඥා පනතේ 149 වන ජේදය යටතේ ව්‍යාපාරය ලියාපදිංචි කල යුතු අතර එම ලියාපදිංචි කිරීමේ සහතික පිටපතක් තෝරාගත් ලංසුකරු විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදිය යුතුය.

16. කඩකාමරයේ ව්‍යාපාරික කටයුතු සදහා හෝ වෙනත් කටයුත්තක් සදහා ජල සැලසුම් ලබා නොගත යුතුය.

17. ලබා ගන්නා කඩකාමරය සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ බාහිර පාර්ශවයකට බදුදීම ,පැවරීම, කුලියට දීම හෝ අන් ආකාරයට අන්සතු කිරීම විකිණීම සම්පූර්ණයෙන් තහනම් වේ. තවද ඒ සම්බන්ධයෙන් කරුණු තහවුරු වුවහොත් එම කඩකාමරයේ සන්තකය නැවත මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීමේ සම්පූර්ණ බලය මාර්ග සංවර්ධන අධිකාරියට ඇත.

18. අනපනත් හෝ කොන්දේසි උල්ලංඝණය කිරීමක් හෝ කඩ වීමක් හේතුකොටගෙන කුමන අවස්ථාවක හෝ බදු ගිවිසුම අවලංගු කිරීමට සිදුවුව හොත් ඒ සදහා මාර්ග සංවර්ධන අධිකාරියට බලය ඇති අතර එයට කවර ආකාරයෙන් හෝ බලපෑමක් සිදු කිරීමට බදු හිමිකරුට අයිතියක් නොමැත.

19. තෝරාගත් ලංසුකරු විසින් ලබාදී ඇති කඩකාමරය පරීක්ෂා කර බැලීමට අලුත්වැඩියා කිරීමට හෝ වෙනත් කාර්යක් සදහා අධිකාරියේ බලයලත් නිලධාරීන්ට එහි සේවකයින්ට ඇතුල්වීමට අවසර දිය යුතු අතර,එසේ කිරීම සදහා අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුය.

## 3. නඩත්තු කරන ආකාරය:

1. මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිගේ හෝ ඔහුගේ බලයලත් නිළධාරියෙකුගේ ලිඛිත අනුමැතියකින් තොරව කඩකාමරයට කිසිදු වෙනසක් කිරීමට හෝ අලුතින් කොටසක් එකතු කිරිම සම්පුර්ණයෙන් තහනම් වේ.

2. කඩකාමරය යථාතත්වයෙන් පවත්වාගෙන යාමට තෝරා ගත් බදු හිමිකරු බැදී සිටින අතර, ඔහුගේ හෝ ඇයගේ සේවකයින්ගේ හෝ නියෝජිතයින්ගේ හෝ පාරිභෝගිකයින්ගේ හෝ ඕනෑකමින් හෝ නොසැලකිලිමත්කම හේතුකොටගෙන කඩකාමරයට කිසියම් අලාභ හානියක් සිදු වුවහොත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් එම අලාභහානිය තක්සේරු කල පසු එම මුදල තෝරා ගත් බදු හිමිකරු විසින් ගෙවිය යුතුය. තවද බදු හිමිකරු සතු භාණ්ඩවලට උපකරණ වලට හෝ පාරිභෝගිකයන්ට සිදුවන කුමන අන්දමේ හෝ අලාභානි සදහා වගකීමට මෙම අධිකාරිය බැදී නොසිටි.

3. මෙහි සියළු කඩකාමර පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු මහනුවර ප්‍රධාන ඉංජිනේරුගේ අදාල උපදෙස් පරිදි මහනුවර විධායක ඉංජිනේනේරුගේ අධීක්ෂණය යටතේ සිදු විය යුතුය.

4. මෙම මගී උමං මාර්ගයේ මගී ජනතාවට ආකර්ෂණීය වන පරිදි පිරිසිදුව හා අලංකාර ලෙස ක්‍රමවත්ව පවත්වාගෙන යාම සියළුම බදු හිමිකරුවන්ගේ යුතුකම හා වගකීම වන්නේය.

## 04. තෝරාගන්නා පදනම:

1. එක් ලංසුකරුවෙකු විසින් ඕනෑම කඩකාමරයක් සදහා වෙන් වෙන් වශයෙන් ලංසු ඉදිරිපත් කළ හැකිය.

2. ඒ අතරින් කඩකාමර සදහා ඉදිරිපත් කර ඇති සියළුම සුදුසුකම් සපුරා ඇති ඉහළම ලංසුව තෝරා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබේ.

3. ව්‍යාපාරයේ ස්වාභාවය සළකා බලනු ලැබේ.

4. මෙම ටෙන්ඩරය ලබාදීම හෝ ප්‍රතිකෂේප කිරීමේ පූර්ණ අයිතිය සම්බන්ධ අවසන් තීරණ ගැනීම මාර්ග සංවර්ධන අධිකාරියේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

.......................................

ප්‍රධාන ඉංජිනේරු
මාර්ග සංවර්ධන අධිකාරිය.
මහනුවර.